මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය



# ස්ත්‍රී පුරුෂ භාවය අනුව ශ්‍රී ලංකාවේ ආර්ථික වශයෙන් ක්‍රියාශීලී ජනගහනය පිළිබඳ අධ්‍යයනය

# ශ්‍රී ලංකාවේ ආර්ථික වශයෙන් ක්‍රියාශීලී ජනගහනය (ස්ත්‍රී පුරුෂ භාවය අනුව)

## හැඳින්වීම

ශ්‍රම බලකාය හෙවත් ආර්ථික වශයෙන් ක්‍රියාශීලී ජනගහනය යනු රැකියා අවස්ථා පිළිබඳව සලකනු ලබන වඩා පුළුල් වූ මිනුමකි. ජනගහනයේ කාලීන වූ රැකියා නියුක්ති හා වියුක්ති තත්වයන් මෙන්ම කාලීන රැකියාවන්හි ලක්ෂණයන් හඳුනා ගැනීමට මෙය භාවිතා කරනු ලබයි. ආර්ථික වශයෙන් ක්‍රියාකාරි ජන සංඛ්‍යාව ලෙස එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් හඳුන්වා දී ඇත්තේ, කිසියම් නිශ්චිත කාල පරිච්ඡේදයක් තුළදී ආර්ථික වටිනාකමක් ඇති භාණ්ඩයක් හෝ සේවාවක් නිෂ්පාදනය කිරීම සඳහා ශ්‍රමය සපයන සිවිල් හා හමුදා අංශ වල සේවය කරන ස්ත්‍රී පුරුෂ සියලුම පුද්ගලයින් සහ එවැනි කටයුතු සඳහා ශ්‍රමය සැපයීමට කැමති පුද්ගලයින්ය.(United Nations -1967)

නිශ්චිත වයස් සීමාව ලෙස හඳුන්වන්නේ සාමාන්‍යයෙන් ශ්‍රම බලකායට ඇතුළත් කරන්නා වූ වයස හා ඉන් පිට විය යුතු වයස අතර පරතරයයි. එක්සත් ජාතීන්ගේ සංවිධානයට හා ලෝක ජාත්‍යන්තර කම්කරු සංවිධානයට අනුව මෙම නිශ්චිත වයස් සීමාව ලෙස සලකන්නේ අවුරුදු 15-64 ත් අතර කාලයයි. නමුත් මෙම වයස් සීමාව ස්ථිර වූවක් නොවේ. විවිධ රටවල මෙම වයස් සීමාවේ වෙනස්වීමක් දැකිය හැක.

උදාහරණ වශයෙන් කෘෂි කාර්මික රටක කුඩා දරුවන් පමණක් නොව අවුරුදු 64ට වැඩි පිරිස් ද ශ්‍රමය සැපයීමට දායක වේ. එවිට මෙම වයස් සීමාව වෙනස් වේ.

එම නිසා ඇතැම් රටවල අවම වයස් සීමාව අවුරුදු 10 ලෙස ගැනේ. එමෙන්ම උපරිම වයස් සීමාව අවුරුදු 70 ලෙස ගන්නා රටවල් ද පවතී. බොහොමයක් සංවර්ධනය වෙමින් පවතින රටවල උපරිම වයස් සීමාවක් අර්ථ දක්වන්නේ නැත.

### 01. ආර්ථික වශයෙන් ක්‍රියාශීලී ජනගහනය

ශ්‍රී ලංකාවේ මුළු ජනගහනයෙන් වයස අවු. 15 හා ඊට වැඩි ජනගහනය වැඩ කරන වයසේ පසුවන ජනගහනය ලෙස සලකනු ලැබේ. 2018 වසරේ තුන්වන කාර්තුවේදී ශ්‍රී ලංකාවේ ඇස්තමේන්තු ගත වැඩ කරන වයසේ පසුවන ජනගහනය මිලියන 16.2 ක් ලෙස වාර්තා වේ. මෙය 2017 වසරේ තුන්වන කාර්තුව හා සසඳන කළ 0.3% ක වැඩිවීමකි. මේ සඳහා ශුද්ධ සංක්‍රමනයන් හා අභ්‍යන්තර සංචලනයන් හේතු වීමට ඉඩ ඇත.

වැඩ කරන වයසේ ජනගහනය අතුරින් සලකනු ලබන සමීක්ෂණ යොමු කාලය තුළ රැකියා නියුතු හෝ රැකියා විරහිත මුළු ජනගහනය ආර්ථික වශයෙන් ක්‍රියාශීලී ජනගහනය හෙවත් ශ්‍රම බලකාය වේ. 2018 වසරේ තුන්වන කාර්තුවේදී ශ්‍රී ලංකාවේ ඇස්තමේන්තුගත ආර්ථික වශයෙන් ක්‍රියාශීලී ජනගහනය මිලියන 8.4 ක් ලෙස වාර්තා වේ.

ශ්‍රම බලකායට අයත් වන පුද්ගලයින් සංඛ්‍යාව, වැඩකරන වයසේ ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස ගත් විට ශ්‍රම බල සහභාගිත්ව අනුපාතය (LFPR) ලෙස හඳුන්වනු ලබයි. 2018 වසරේ තුන්වන කාර්තුවට අදාල සමීක්ෂණ ප්‍රතිඵලවලට අනුව ශ්‍රී ලංකාවේ සමස්ථ ශ්‍රම බල සහභාගිත්ව අනුපාතය 51.8%ක් විය.

පුද්ගලයෙකු අදාල සමීක්ෂණ යොමු කාලය තුල අවම වශයෙන් පැයක්වත් වැටුප් ලබන සේවකයෙකු, සේවායෝජකයෙකු, තමාගේ වැඩ කටයුතු කරන්නෙකු හෝ පවුලේ ආර්ථික කටයුතුවලට දායකවන්නෙකු ලෙස කිසියම් වැඩක නිරත වූයේ නම් එම පුද්ගලයා රැකියා නියුතු පුද්ගලයෙකු ලෙස හඳුන්වනු ලබයි. මෙම කාර්තුව සඳහා ඇස්තමේන්තුගත රැකියා නියුක්තිකයින් ප්‍රමාණය මිලියන 8.2 ක් වේ.

අදාල සමීක්ෂණ යොමු කාලය තුළ රැකියාවක් නොමැති, සමීක්ෂණයට පෙර සති 4 ක කාලය තුල රැකියාවක් සොයමින් සිටි හා රැකියාවක් සෙවීමට කිසියම් ක්‍රියා මාර්ගයක් ගත්, ඉදිරි සති 2 තුල රැකියාවක් ලැබුණහොත් එය කිරීමට හැකියාව ඇති පුද්ගලයින් රැකියා විරහිත පුද්ගලයින් සේ සලකනු ලබයි. මුළු රැකියා විරහිත පුද්ගලයින් සංඛ්‍යාව, ශ්‍රම බලකායේ ප්‍රතිශතයක් ලෙස ගත්විට විරැකියා අනුපාතය ලෙස හඳුන්වනු ලබයි. 2018 වසරේ තුන්වන කාර්තුවේදි ඇස්තමේන්තු ගත රැකියා වියුක්ති අනුපාතය 4.1% ක් වේ.

## 02. ශ්‍රී ලංකාවේ ආර්ථික වශයෙන් ක්‍රියාශීලී ජනගහනයේ ව්‍යාප්තිය - අංශ අනුව සහ ස්ත්‍රී පුරුෂ භාවය අනුව

| අංශය | ආර්ථික වශයෙන් ක්‍රියාශීලී ජනගහනය | | | | | |
|---|---|---|---|---|---|---|
| | එකතුව | % | පුරුෂ | % | ස්ත්‍රී | % |
| ශ්‍රී ලංකා | 8387701 | 100.0 | 5423477 | 64.7 | 2964224 | 35.3 |
| නාගරික | 1415096 | 100.0 | 966184 | 68.3 | 448912 | 31.7 |
| ග්‍රාමීය | 6559812 | 100.0 | 4215166 | 64.3 | 2344646 | 35.7 |
| වතු | 412794 | 100.0 | 242127 | 58.7 | 170666 | 41.3 |

වගු අංක 01:

2018 වසරේ තුන්වන කාර්තුවේදී ශ්‍රී ලංකාවේ ඇස්තමේන්තුගත ආර්ථික වශයෙන් ක්‍රියාශීලී ජනගහනය මිලියන 8.4 ක් ලෙස වාර්තා වේ. එසේම ඉහත වගුවට අනුව ශ්‍රී ලංකාවේ සමස්තය දෙස බලන විට පෙනී යන්නේ ආර්ථික වශයෙන් ක්‍රියාශීලී ජනගහනයෙන් 64.7% ක් වැනි පිරිසක් පුරුෂයින්වන අතර එයට සාපේක්ෂව ස්ත්‍රී පක්ෂය 35.3% ක් වශයෙන් අඩු අගයක් ගෙන ඇති බවයි. මෙය ආංශික වශයෙන්ද එවැනිම තත්වයක් පෙන්නුම් කරයි. නාගරික අංශයේදී පුරුෂ පක්ෂය 68.3% ක් ලෙසද ස්ත්‍රීන් 31.7% ක් ලෙසද ව්‍යාප්ත වී ඇති අතර පිළිවෙලින් ග්‍රාමීයව 64.3% ක් සහ 35.7% ක්

වශයෙන්ද වතු 58.7% ක් සහ 41.3% ක් වශයෙන්ද ව්‍යාප්තව වී ඇත. එසේම වතු මට්ටමේදී ආර්ථික වශයෙන් ක්‍රියාශීලී ජනගහනය අනිකුත් අංශවලට වඩා ඉහල අනුපාතයක් පෙන්නුම් කරයි.




රූප සටහන 01 :

ඉහත රූප සටහන මඟින් ද පැහැදිලි වන්නේ නාගරික, ග්‍රාමීය සහ වතු යන සෑම අංශයකම ස්ත්‍රී පක්ෂයට වඩා පුරුෂ පක්ෂය වැඩි අගයක් ගෙන ඇති බවයි.

**03. ස්ත්‍රී පුරුෂ භාවය අනුව ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතය වයස් කාණ්ඩ අනුව ( 2018 තුන්වන කාර්තුව )**

| වයස් කාණ්ඩ | එකතුව | පුරුෂ | ස්ත්‍රී |
|---|---|---|---|
| **ශ්‍රී ලංකා** | 51.8 | 72.7 | 34.0 |
| **15-19** | 12.1 | 17.1 | 7.2 |
| **20-24** | 53.3 | 72.5 | 36.8 |
| **25-29** | 67.1 | 92.5 | 44.5 |
| **30-34** | 66.7 | 97.0 | 41.9 |
| **35-39** | 67.6 | 96.6 | 45.3 |
| **40-44** | 66.5 | 95.6 | 42.8 |
| **45-49** | 70.4 | 93.9 | 48.3 |
| **50-54** | 67.6 | 94.5 | 49.3 |
| **55-59** | 62.6 | 84.5 | 41.6 |
| **60*** | 29.5 | 45.3 | 16.5 |

*මූලාශ්‍රය : ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව*

වගු අංක 02 :

විවිධ වයස් කාණ්ඩ අතර ශ්‍රමබල සහභාගිත්වතා අනුපාතය සැසඳීමේදී පෙනීයන විශේෂ කරුණක් වන්නේ මැදි වයස් කාණ්ඩවල ශ්‍රමබල සහභාගිත්වතා අනුපාත අගය ඉහළ මට්ටමක පවතින බවයි. 15- 19 ත් අතර අඩු වයස් කාණ්ඩයවන අතර එහි අගය 12.1% ක ඉතා අඩු අගයන් පෙන්නුම් කරන අතර වයස අවුරුදු 60 ට වැඩි කාණ්ඩයේ සහභාගිත්වතා අනුපාතය 29.5 %ක් ලෙස අඩු අගයක්ව පවතී. මෙම වගුවට අනුව පෙනීයන විශේෂ ලක්ෂණයක් වන්නේ සෑම වයස් කාණ්ඩයකම පුරුෂ පක්ෂයේ ශ්‍රමබල සහභාගීත්වතා අනුපාතයන් ඉහල මට්ටමකත් එයට සාපේක්ෂව ස්ත්‍රී පක්ෂයේ ශ්‍රමබල සහභාගිත්වතා අනුපාතයන් පහල මට්ටමකත් පවතින බවයි.

**04.** **ස්ත්‍රී පුරුෂ භාවය අනුව ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතය - වාර්ෂිකව**

| වර්ෂය | එකතුව | පුරුෂ | ස්ත්‍රී |
|---|---|---|---|
| **2000** | 50.3 | 67.2 | 33.9 |
| **2005** | 48.3 | 67.1 | 30.9 |
| **2010** | 48.1 | 67.1 | 31.2 |
| **2015** | 53.8 | 74.7 | 35.9 |
| **2017** | 54.1 | 74.5 | 36.6 |

*මූලාශ්‍රය : ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව*

වගු අංක 03 :

ඉහත වගුවට අනුව වාර්ෂිකව සැසඳීමේදී පෙනීයන කරුණක් වන්නේ සෑම වර්ෂයකදීම ශ්‍රී ලංකාවේ ශ්‍රමබල සහභාගිත්ව අනුපාතයේ ඉහල අගයක් ගෙන ඇත්තේ පුරුෂ පක්ෂය බවත් සහ ඊට සාපේක්ෂව කාන්තා පක්ෂය ඉතා අඩු අනුපාතයකින් යුක්ත වී ඇති බවයි. එසේම වාර්ෂිකව ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතයන් සැසඳීමේදී පෙනීයන තවත් විශේෂ කරුණක් වන්නේ 2000 වර්ෂයට සාපේක්ෂව 2005 හා 2010 වර්ෂයන්හිදී ක්‍රමයෙන් අඩුවෙමින් ගොස් නැවත 2015 වර්ෂයේ වැඩි වීමක් පෙන්නුම් කර ඇති අතර 2017 වර්ෂය වන විට ශ්‍රම බලකා සහභාගිත්වතා අනුපාතය 54.1% ක් ලෙස ඉහළ අගයක් ගෙන ඇත.

**05. රැකියා නියුක්ති, රැකියා වියුක්ති සහ ආර්ථික වශයෙන් ක්‍රියාශීලී නොවන ජනගහනය වැඩකල හැකි ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස**

| | **2000** | **2005** | **2010** | **2015** | **2017** |
|---|---|---|---|---|---|
| රැකියා නියුක්තිය | 46.5 | 44.6 | 45.7 | 51.2 | 51.8 |
| රැකියා වියුක්තිය | 3.8 | 3.7 | 2.4 | 2.5 | 2.3 |
| ආර්ථික වශයෙන් ක්‍රියාශීලී නොවන ජනගහනය | 49.7 | 51.7 | 51.9 | 46.3 | 45.9 |

*මූලාශ්‍රය : ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව*

වගු අංක 04 :

ඉහත වගුවට අනුව 2000 වර්ෂයේ දී 46.5 ක් වූ ශ්‍රී ලංකාවේ රැකියා නියුක්ති අනුපාතය 2017 වර්ෂයේ 51.8 ක් වශයෙන් ඉහල අනුපාතයක් පෙන්නුම් කරයි. සේවා වියුක්ති අනුපාතය 2000 වසරට සාපේක්ෂව 2017 වර්ෂය වන විට 2.3 ක් ලෙස පහල අගයක් ගෙන ඇත. එසේම ආර්ථික වශයෙන් ක්‍රියාශීලී නොවන ජනගහනයේ 2000 වර්ෂය වන විට පැවති 49.7 ක අඩු තත්වය 2005 සහ 2010 වර්ෂවලදී වැඩි වී 2015 වර්ෂයේදී 46.3 ලෙස අඩු අගයක් ගෙන ඇත. එය 2017 වර්ෂයේදී 45.9 ක් ලෙස තවත් අඩු අගයක් ගෙන ඇති බව පෙනීයයි.

## විවරණය

- මෙම අධ්‍යයනයට අනුව පෙනී යන්නේ ශ්‍රී ලංකාවේ ආර්ථික වශයෙන් ක්‍රියාශීලී ජනගහනයෙන් වැඩි පිරිසක් පුරුෂ පාර්ෂවය නියෝජනය කරනු ලබන බවයි. මෙය නාගරික, ග්‍රාමීය හා වතු යන අංශ තුනේදීම එවැනි තත්වයක් පෙන්නුම් කරයි. නමුත් වතු අංශය තුලදී අනිකුත් අංශයන්ට සාපේක්ෂව කාන්තා දායකත්වය ඉහල ප්‍රතිශතයක් ගෙන ඇත. වතු ආශ්‍රිතව කාන්තා ශ්‍රමිකයින් වැඩි වශයෙන් යොදා ගැනීම ද ග්‍රාමීය කාන්තාවන් කෘෂි කාර්මික කටයුතුවල නියැලීම සහ ස්වයං රැකියාවල නිරත වීම ආදී හේතූන් එම අංශයන්හි කාන්තා දායකත්වය නාගරික අංශයට වඩා වැඩි වීමට හේතු විය හැකිය.
- ශ්‍රමබල සහභාගිත්වතා අනුපාතයන් පිළිබඳව විමසිලිමත් වීමේදී පෙනී යන්නේ අඩු වයස් කාණ්ඩ වලදී ආර්ථික වශයෙන් ක්‍රියාශීලිත්වය ඉතා අඩු මට්ටමක පවතින බවත්, වයස අවු. 60 ට වැඩිවන විට ශ්‍රමබල දායකත්වය අඩුවන බවත්ය. ආර්ථික වශයෙන් ක්‍රියාශීලීත්වය වැඩිවශයෙන් පෙන්නුම් කරන්නේ මැදි වයස් කාණ්ඩයට අයත් පිරිසවන බව මූලික වශයෙන් පෙනී යයි. මෙහිදී 15 – 19 වයස් කාණ්ඩ පුද්ගලයන්ගේ ශ්‍රම බල සහභාගිත්වය අඩු වීමට ප්‍රධාන වශයෙන් හේතු විය හැක්කේ එම කාණ්ඩයට අයත් පිරිස පූර්ණ කාලීන අධ්‍යාන සඳහා යොමු වී සිටීමයි. එසේම වයස අවු 60 ට වැඩි වැඩිහිට ශ්‍රම බලකාය විශ්‍රාමික වැඩිහිටියන් වීම වැඩිහිටි ශ්‍රමබල සහභාගීත්වය අඩු වීමට හේතුවිය හැක.

- ශ්‍රමබල සහභාගීත්වතා අනුපාතිකය වාර්ෂිකව විග්‍ර කර බැලීමේදී පෙනී යන්නේ 2000 වර්ෂයේ පැවති සමස්ථ ශ්‍රම බලකා සහභාගීත්වයට සාපේක්ෂව 2017 වර්ෂයවන විට වැඩි වීමක් පෙන්නුම් කරන බවයි. එසේම සමස්ත ශ්‍රමබල සහභාගීත්ව අනුපාතයේ ඉහල අගයක් පුරුෂ පක්ෂය ගෙන ඇති අතර කාන්තා සහභාගිත්වය පුරුෂ සහභාගීත්වයට සාපේක්ෂව අඩු අගයක් පෙන්නුම් කරනු ලබයි. කාන්තාවන් ගෘහ කටයුතු වල නියුතු වීම, දරුවන් රැකබලා ගැනීම ආදී හේතූන්මත ආර්ථික කටයුතුවල නියැලීමෙන් වැලකී සිටීම ආදී හේතූන් මේ සඳහා මුල්විය හැක. තවද ආර්ථික සමාජීය ආගමික හා සංස්කෘතිකමය වශයෙන් හේතු ගණනාවක් මේ සඳහා මුල්විය හැක. එනම් ඉහල ආර්ථික හැකියාවක් ඇති පවුල් තුලින් කාන්තාවන් රැකියා සඳහා යොමු වීම අඩු විය හැකි සේම සමාජමය හා සංස්කාතිකමය හේතුමත කාන්තාවන් රැකියා සඳහා යොමු නොවීම හා විවිධ ආගමික හා සමාජ ස්ථරයන්ට අයත් කාන්තාවන් රැකියා සඳහා යොමු වීමට ඇති අකමැත්ත ආදී හේතූන් කාන්තාවන් ශ්‍රම දායකත්වය ආර්ථික වර්ධනය සඳහා යොදා ගැනීමට ඇති බාධාවන් ලෙස පෙන්වා දිය හැකිය. එසේම ආබාධිත පිරිසද ආබාධික තත්වයන් හේතුවෙන් ආර්ථික කටයුතුවලින් ඈත් වී සිටීමේ හේතුවද ශ්‍රමබල සහභාගීත්වතා අනුපාතයන්හි වෙනස් වීම්වලට හේතු වේ.
- ශ්‍රී ලංකාවේ සේවා නියුක්තිය පිළිබඳව සහ වියුක්තිය පිළිබඳව අවධානය යොමු කිරීමේදී විශේෂයෙන් දක්නට ලැබෙන කරුණක් වන්නේ වසර කිහිපයක සිටම සමස්ත සේවා නියුක්තියේ වෙනස් වීම් ධනාත්මක අගයක ගමන් කර ඇති බවයි. එනමුත් 2005 වර්ෂයේ දී පමණක් 2000 වර්ෂයට වඩා අඩු අගයක් පෙන්නුම් කර ඇත. ඒ අනුව අවධාරණය කළ හැක්කේ 2000 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා සමස්ත සේවා නියුක්තියේ යම් වැඩි වීමක් සිදු වී ඇති බවයි. එසේ වුවද මෙහිදී පෙනී යන මූලික කරුණක් වන්නේ 2000 වර්ෂයේ ආර්ථික වශයෙන් ක්‍රියාශීලී ජනගහනය සහ නොවන ජනගහනය අතර වෙනස 0.6 ක් වූ අතර, 2005 , 2010 වර්ෂවලදී සෘණ අගයක් ලෙස පෙන්නුම් කරයි. එනමුත් 2015 සහ 17 වර්ෂවන විට එය 7.4 හා 8.2 ක් ලෙස ධනාත්මක අගයක් පෙන්නුම් කර ඇත. ඒ අනුව 2000 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා ආර්ථික වශයෙන් ක්‍රියාශීලී ජනගහනයේ වර්ධණය වීමක් දක්නට ලැබෙයි. මෙය ආර්ථිකයේ ප්‍රගමනයට හේතුවන කරුණකි. මේ සඳහා රැකියා අවස්ථාවන් වැඩි කිරීම, අධ්‍යාපන අවස්ථාවන් වැඩිවීම, තරගකාරී ජීවන රටාවන් සඳහා ජනතාව පෙලබීම ආදී කරුණු ගණනාවක් බලපෑමට ඉඩ ඇත.

## නිගමන හා යෝජනා

- ඉහත විවරණයන්ට අනුව ශ්‍රී ලංකාවේ ආර්ථික වශයෙන් ක්‍රියාශීලී ජනගහනය සෑම අංශයකින්ම සහ වයස් කාණ්ඩ අනුව වාර්ෂිකව විග්‍රහ කිරීමේදී පෙනී යන්නේ වැඩි ප්‍රතිශතයක් නියෝජනය වන්නේ පුරුෂ පක්ෂ බවයි.
- ආංශික විග්‍රහයේදී නාගරික මට්ටමේ ස්ත්‍රී ආර්ථික දායකත්වය වතු සහ ග්‍රාමීය මට්ටමේ ස්ත්‍රී ආර්ථික දායකත්වයට වඩා අඩු මට්ටමක් පෙන්නුම් කරයි. මෙයට හේතු විය හැක්කේ එම අංශවල දරිද්‍රතාවය සහ යොමුවිය හැකි ආවේනික වූ ජීවන රටාවන් ගොඩ නැගී තිබීම විය හැකිය. නාගරික මට්ටමේදී ද දරිද්‍රතාවයෙන් පෙලෙන කුටුම්බයන් පැවතිය ද කාන්තාවන්ට යොමු විය හැකි ආර්ථික ඉපැයුම් මාර්ගයන් බොහෝ විට නීති විරෝධී සහ සමාජ විරෝධී ඉපැයීම් මාර්ග විය හැක. ඒවා ඇතැම් අවස්ථා වලදී ආර්ථික ගණනය කිරීම් වලට ඇතුලත් නොවන අවස්ථා ද ඇත.

  ආර්ථික වශයෙන් ක්‍රියාශීලී ජනගහන පිළිබඳ අවධානය යොමු කිරීමේදී පුරුෂ මෙන්ම ස්ත්‍රීන්ද ඉහල ප්‍රතිශතයක් ගෙන තිබීම සමස්ත ආර්ථිකයේ ප්‍රගමනයට හේතුවන හෙයින් සෑම අංශයකදීම මෙම දෙපිරිසම බලගැන්වීම සිදුකල යුතු වේ. නාගරික මට්ටමේ කාන්තාවන් සඳහා ආර්ථිකමය වටිනා කමක් ලබා දීමට කාන්තා කේන්ද්‍රීය පුහුණු වැඩසටහන් පැවැත්වීම, පුද්ගලික අංශයේ රැකියා අවස්ථාවන් සහ නැගී එන කර්මාන්තවල හිමිකම ඉහල නැංවීමට රාජ්‍ය අංශය මුලික වී කටයුතු කල යුතුය. තවද ග්‍රාමීය මට්ටමේදී කෘෂිකාර්මික කටයුතු නැංවීම සහ ඒවායේ නව අතුරු නිශ්පාදන ඇති කිරීමට සහ ඒ සඳහා අවශ්‍ය දැනුම ලබා දීමද ගෘහ කටයුතුවල නියැලෙමින් යම් ආර්ථික කටයුත්තක නියැලීම සඳහා යොමු වීමට අවස්ථාව ලබා දීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමටද කටයුතු කලයුතුය. ඒ සඳහා රජයේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මඟින් ක්‍රියාත්මක කරනු ලබන විවිධ ව්‍යාපෘතිවල සයහ ලබා ගත හැකිය.
- ස්ත්‍රී පුරුෂ භාවය අනුව ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකා සහභාගීත්ව පිළිබඳව සැලකිලිමත් වීමේදී 2017 වර්ෂට සාපේෂව 2018 තුන්වන කාර්තුවේදී අඩුවීමක් පෙන්නුම් කරන අතර ස්ත්‍රී සහ පුරුෂ වශයෙන් විසීමේදී ද එම ප්‍රතිශතයෙහි අඩු වීම එලෙසින්ම පවතී. එසේම ශ්‍රම බල සහභාගීත්වය පුරුෂ පාර්ෂවයට සාපේක්ෂව 50% ක පමණ අඩු ප්‍රතිශතයක් ස්ත්‍රී පාර්ෂවය ගෙන ඇත. ඒ සඳහා කාන්තාවන් ස්වයං රැකියා සඳහා යොමු කිරීම හා එයට අවශ්‍ය පහසුකම් සපයාදීම, ඒ සඳහා වෙළඳපොල විවෘත්ත කරදීම, ඉහල ප්‍රමිතියෙන් යුතු දිවා සුරැකුම් මධ්‍යස්ථාන ඇති කිරීම හා කාන්තාවන් ඵලදායී ලෙස ශ්‍රම බලකායට එක්වීම සීමා කරන යල්පැන ගිය නීති රීති නිසා සහභාගීත්වය හා නිෂ්පාදන මට්ටම් පහත වැටීමට අවකාශය ඇති බැවින් ඒ සඳහා නව නීති රීති ගෙන ඒමට රජය මූලිකත්වය ගෙන ක්‍රියා කළ යුතු වෙයි. එසේම පුද්ගලික අංශයේ ප්‍රසූති නිවාඩු පහසුකම් මෙන්ම තෘතීය හා වෘත්තීය අධ්‍යයන පහසුකම් ලබා ගැනීම සම්බන්ධයෙන් ද වර්තමානයේ පවතින තත්වයන් වැඩි දියුණු කලයුතු වෙයි.

- වයස අනුව ආර්ථිකයට දක්වන දායකත්වය වෙනස්කම්වලට භාජනයවන බව පැහැදිලි කරුණක් වේ මෙහිදී අඩු වයස් කාණ්ඩවල පුද්ගලයන් අධ්‍යාපනික කටයුතුවල නියැලී සිටීම හේතුවෙන් එසේ වීමට හැකි බැවින් එම කණ්ඩායම ආර්ථිකමය කටයුතුවල යෙදවීමට දිරිගැන්වීම වෙනුවට ශ්‍රම වෙළඳපොල අවශ්‍යතාවයන්ට ගැලපෙන ආකාරයෙන් අධ්‍යාපනය ලබා දීමට කටයුතු කිරීම අත්‍යාවශ්‍ය වේ. එසේම වයස අවුරුදු 60 ට වැඩි වැඩිහිටි පිරිස නිවසේ සිට නිරතවිය හැකි ආදායම් උත්පාදන මාර්ග සඳහා යොමු කිරීමට අවශ්‍ය දිරි ගැන්වීම් හා දැනුම ලබා දීමට කටයුතු කල යුතුවේ. මැද වයස් කාණ්ඩ වලට අයත් පිරිස තුල වැඩි පිරිසක් ආර්ථික වශයෙන් ක්‍රියාශීලී කොටසට අයත්වන අතර කාන්තාවන්ගේ යම් අඩුවක් දක්නට ලැබේ. එය පුරුෂ සහභාගීත්වයට සාපේක්ෂව අඩක් පමණ සංඛ්‍යාවක් වන බැවින් කාන්තාවන්ගේ ආර්ථික දායකත්වය නැංවීමට විශේෂ ක්‍රියාමාර්ග ගත යුතු වේ.
- දැනට සමස්ත සේවා නියුක්තිය 95.8% ක් ලෙස පවතින අතර මෙම පිරිසෙන් අවිධිමත් හා නීති විරෝධී ආර්ථික ක්‍රියාකාරකම්වල යෙදෙන පිරිස සහ අවදානම් ගණයේ රැකියාවල නිරත වී සිටින පිරිසද සැලකිය යුතු  ප්‍රමාණයක් සිටිය හැකිය. එම පිරිස හඳුනා ගනිමින් අවිධිමත් සහ නීතිවිරෝධී  ආර්ථික ක්‍රියාකාරකම් වෙනුවට විධිමත් නීත්‍යානුකූල රැකියා අවස්ථාවන් සඳහා ඔවුන් යොමු කිරීමට රාජ්‍ය අංශය මැදිහත් වීම අත්‍යාවශ්‍ය වේ.එසේම එවැනි පිරිස් ජාත්‍යන්තරව පිළිගත් සහතිකයක් හෝ බලපත්‍රයක් ලබාදීම මඟින් සමාජ පිළිගැනීම හා සේවා සුරක්ෂාව තහවුරු කර, සියළු රැකියාවන්හි ප්‍රමිතිය නංවාලීමට කටයුතු කිරීම වඩාත් ඵලදායී වනු ඇත. එය රැකියාවන්හි අවිධිමත් භාවය අවම කිරීමට ද හේතු විය හැක. එසේම අවදානම් සහගත රැකියාවන්වල නියුතු පුද්ගලයන් සඳහා විශ්‍රාම ප්‍රතිලාභ ක්‍රමවේදයක් හඳුන්වාදීම සියළු පුරවැසියන්ට වැඩි ආදායම් සහ උසස් ජීවන තත්වයක් ලබා ගත හැකි පරිසරයක් නිර්මාණය කිරීම, කාන්තාවන්ට ආරක්ෂිත සේවා කොන්දේසි සැකසීම, ආදී වූ ක්‍රියාමාර්ග තුළින් ආර්ථිකමය වශයෙන් ක්‍රියාශීලී ජනගහනය ඉහල ප්‍රතිශතයකට ගෙන ඒමටත් ඒ තුළින් ශ්‍රී ලංකාවේ ආර්ථිකය ඉහල නැංවීමටත් හැකිවනු ඇත.